# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No – 10120

ෆැක්ස් / தொலைநகல / Fax – 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone – 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site – www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail – dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO – 647 / 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No – / 2024

දිනය / திக / Date – 15/04/2024 පැය 1130

## මාධ්‍ය නිවේදනය

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**මනුෂ්‍ය ඝාතන සහ මාරක රිය අනතුරු සම්බන්ධව මහජනතාව දැනුවත් කිරීම.- පොලිස් මූලස්ථානය**

2024.04.14 වන දින සහ 15 වන දින තුල සිදුවූ මනුෂ්‍ය ඝාතන සම්බන්ධයෙන් අදාල පොලිස් ස්ථාන මඟින් විමර්ශන ආරම්භ කර ඇත. මෙම ඝාතන හක්මන, ඇලයාපත්තුව, සේරුනුවර සහ ගලේවෙල යන පොලිස් වසම් වලින් වාර්තා වී ඇති අතර පුද්ගලික ආරවුල් හේතුවෙන් මෙම ඝාතන සිදුව ඇති අතර, සැකකරුවන් බීමත්ව සිට ඇති බවටත් දැනට සිදු කරන ලද විමර්ශන වලදී අනාවරණය වී ඇත.

එමෙන්ම ඉහත දිනවල දිවයිනේ පොලිස් වසම් කිහිපයක මාරක රිය අනතුරු 08ක් වාර්තා වී ඇත. මෙම අනතුරු වලින් පුද්ගලයින් 10 දෙනෙකු මියගොස් ඇති අතර පුද්ගලයින් 10 දෙනෙකු බරපතල තුවාල ලබා ප්‍රතිකාර සඳහා රෝහල් ගත කර ඇත.

විවිධ ස්ථාන වල පවත්වන සාද වලට සහභාගී වෙමින් පුද්ගලයින් බීමත්ව ආරවුල් ඇති කර ගනිමින් සිදුවන ඉහත ආකාරයේ මනුෂ්‍ය ඝාතන හා බීමත්ව අපරික්ෂාකාරී ලෙස අධික වේගයෙන් යතුරු පැදි හා වාහන ධාවනය කිරීම තුලින් සිදු වන අනතුරු අවම කර ගැනීම සඳහා මෙම උත්සව සමයේ සැලකිලිමත්ව කටයුතු කරන ලෙස පොලිසිය මහජනතාවගෙන් ඉල්ලා සිටී.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**